එකතුව		68,842,635	389,936	3,037,750	-	68,422,321	70,236,572.65

සටහන -24

පර්යේෂණ හා සංවර්ධන	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
පර්යේෂණ හා සංවර්ධන		442,275				442,275	21,730
එකතුව		442,275	-	-	-	442,275	21,730

සටහන -25

මූල්‍ය වියදම්	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
බැංකු ගාස්තු		390,164				390,164	433,200
එකතුව		390,164	-	-	-	390,164	433,200

සටහන -26

ලැබිය යුතු ආදායම්	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළිය		-			388,195	388,195	660,780
ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොළී		-			394,297	394,297	498,708
නිල නිවස කුලිය		11,399				11,399	11,399
ආපනශාලා කුලිය		5,000			-	5,000	5,000
NVQ ඩිප්ලෝමා ගාස්තු					960,000	960,000	-
එකතුව		16,399	-	-	1,742,492	1,758,891	1,175,887

සටහන -27

ස්ථාවර වත්කම් ණයහිමියෝ	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
මෙට්‍රොපොලිටන් ඉංජිනියරින් (පුද්) සමාගම		406,304				406,304	**406,304**
බී.එස්.ඉංජිනියරින්		6,650				6,650	**6,650**
අබාන්ස් (පුද්.) සමාගම		66,883				66,883	**66,883**
මැක්රෝ ඔටෝ ටෙක්		8,529				8,529	**8,529**
මෙගාහීටර්ස්		53,395				53,395	**53,395**
එන්.ජී.පී. ඉංජිනියරින්		1,047,450				1,047,450	**1,428,661**
ඒසර් මාර්කටින්		116,187				116,187	**116,187**
ඉලෙක්ට්‍රොසවර්		965,976				965,976	**965,976**
ඕරල් සමාගම		51,523				51,523	**51,523**
ඩී.පී.ජේ. හෝල්ඩින්ග්ස්		110,296				110,296	**110,296**
ඩිමෝ		77,761				77,761	**77,761**
ගංගොඩ එන්ටර්ප්‍රයිසස්		30,180				30,180	**30,180**
ඒස් කැම් (පුද්ගලික) සමාගම		90,835				90,835	**90,835**
නෙට් ඉංජිනියරින්		25,303				25,303	**25,303**
ශ්‍රී විජය ඉන්ඩස්ට්‍රීස්		18,161				18,161	**18,161**
ජෝන් කීල්ස් කාර්යාලය		316,344				316,344	**40,994**
යුනිකෝන් මෙටලික්ස්		60,833				60,833	**60,833**
මාල්බෝ ට්‍රේඩින්		-				-	**-**
ඉලෙක්ට්රෝ ඔටෝමොටිව්ස්		300,000				300,000	**300,000**
නේම් බෝඩ්		5,000				5,000	**5,000**
රොක්වෙල් ඉන්ටර්නැෂනල්		32,120				32,120	**32,120**
සන්ඩිරි ක්‍රෙඩිටර්ස්		142,463				142,463	**142,463**
ඇල්කොබ්රොන්ස්		62,500				62,500	**62,500**
ඉන්කො ඉංජිනියරින්		77,874				77,874	**49,629**
ටී.සී.අයි එන්ටප්‍රයිසස්		1,598				1,598	**1,598**
කස්ටම් ඉංජිනියස්		47,000				47,000	**91,838**
වී.එස් ඉන්ෆොමේෂන් සිස්ටම් (පුද්.) සමාගම්		809,850				809,850	**-**
ශ්‍රී ලංකා ස්ටේට් ට්‍රේඩින් (ජෙන්) කොපරේෂන්		3,197,581				3,197,581	**-**
එස්.එස්.වී. කන්ස්ට්‍රක්ෂන්		877,008				877,008	**-**
සිංහගිරි (පුද්.) සමාගම		433,462				433,462	**-**
Service Creditors		826,502				826,502	**-**
අමත්‍යාංශ කාර්යාලය		5,558				5,558	**-**
සොලිනිටා ඉන්ටනැෂනල්(පුද්) සමාගම		81,200				81,200	**-**
මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජිස් (පුද්) සමාගම		29,808				29,808	**-**
ලිස්යෙක් හොල්ඩින් (පුද්) සමාගම		268,207				268,207	**-**
එකතුව		**10,650,341**	**-**	**-**	**-**	**10,650,341**	**4,243,619**

සටහන -28

ගෙවිය යුතු ගිණුම්	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
ගෙවිය යුතු නිවාස ණය						-	**-**
ගෙවිය යුතු පුසම්පාදන						-	**-**
එකතුව		**-**	**-**	**-**	**-**	**-**	**-**

සටහන -29

තොග	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
ලිපිද්‍රව්‍ය		51,567		968,758		1,020,325	**1,137,266**
තින්ත		144,082				144,082	**99,195**
එකතුව		**195,649**	**-**	**968,758**	**-**	**1,164,408**	**1,236,461**

සටහන -30

ස්ථාවර වත්කම් සඳහා අත්තිකාරම්	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
ඉංජිනියරින් ටෙක්නොක්‍රසි (පුද්ගලික) සමාගම		273,324				273,324	**273,324**
ඉන්කො ඉංජිනියරින් (පුද්ගලික) සමාගම		-				-	**519,241**
එකතුව		**273,324**	**-**	**-**	**-**	**273,324**	**792,565**

සටහන **-31**

වලනය නොවන තොග විකුණුම්	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
විකුණුම් වටිනාකම						-	-
පොත් වටිනාකම		-				-	-
						-	-
එකතුව		-	-	-	-	-	-

සටහන **-32**

පෙර වර්ෂ ගැලපුම්	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
දිරි දිමනා ගෙවීම් 2019 සහා 2020		(111,132)			(2,597)	(113,729)	**(455,878)**
2020 නොවැම්බර් මස පූවත්පත් වියදම්		(1,590)				(1,590)	
NVQ පූර්ව තක්සේරු ගාස්තු 2020		(1,500)				(1,500)	
වැඩිපුර ගෙවූ විදුලි වියදම් නිවැරදි කිරීම		(2,581,537)				(2,581,537)	
වැඩිපුර ගෙවූ විදුලි වියදම් නිවැරදි කිරීම		2,581,537				2,581,537	
පෙර වසරේ වියදම් - විගණන ගාස්තු 2018		(559,200)				(559,200)	
වැඩිපුර වෙන් කරන ලද විගණන ගාස්තු -2019		97,600				97,600	
පෙර වසරේ වියදම් - විගණන ගාස්තු 2017							**(646,186)**
පෙර වසරේ වියදම් -ගොඩනැගිලි ක්ෂය ගැලපීම් නිවැරදි කිරීම් (බොරැල්ල)							**(26,284)**
පෙර වසරේ වියදම් -යන්ත්‍ර ක්ෂය ගැලපීම් නිවැරදි කිරීම් (බොරැල්ල)							**50,044**
පෙර වසරේ වියදම් - ඌණ ක්ෂය ගැලපීම් නිවැරදි කිරීම් (ලංජකාඅඅා)							**(13,634,133)**
පෙර වසරේ වියදම් - අධි ක්ෂය ගැලපීම් නිවැරදි කිරීම් (ලංජකාඅඅා)							**9,721,307**
අතිකාල ගිණුම් නිවැරදි කිරීම් 2018 සහා 2019							**(253,210)**
පෙර වසරේ වියදම් - ස්ථාවර තැම්පතු පොලි නිවැරදි කිරීම්							**312,367**
පෙර වසරේ ආදායම් - ණය ගැතියන් ඔටෝමැටිව් ටෙක්							**198,500**
ගොඩනැගිලි - ශ්‍රීලංජපුඅා				(49,576,860)		(49,576,860)	
ලී බඩු සහ කාර්යාල උපකරණ				(413)		(413)	
පුහුණු උපකරණ				(6,199,499)		(6,199,499)	
පරිගණක සහ උපාංග				(12,367)		(12,367)	
නේවාසිකාගාර කුලිය ගැලපීම				441,296		441,296	
තොගය							
එකතුව		**(575,822)**	**-**	**(55,347,843)**	**(2,597)**	**(55,926,262)**	**(4,733,472)**

සටහන **-33**

පුහුණු හා හැකියා වර්ධන වියදම්-ප්‍රාග්ධන වියදම්	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
						-	-
පුහුණු හා සංවර්ධන-SSDP	38	-				-	-
පුහුණු හා සංවර්ධන		586,000				586,000	**472,142**
පුහුණු හා සංවර්ධන ගිණුමට මාරු කිරීම්	19	(586,000)				(586,000)	**(472,142)**
එකතුව		**-**	**-**	**-**	**-**	**-**	**-**

සටහන **-34**

විවිධ ආදායම්-අර්ධකාලීන	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
විභාග ගාස්තු		-			92,500	92,500	**2,250**
ෙක්සිබල් ලර්නින්					334,975	334,975	
අනෙකුත් ආදායම්		-			905,525	905,525	**4,550**
						-	**-**
එකතුව		**-**	**-**	**-**	**1,333,000**	**1,333,000**	**6,800**

සටහන **-35**

ඩිප්ලෝමා පාඨමාලා දීමනා- NVQ	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
පාඨමාලා ගාස්තු						-	
ලියාපදිංචි ගාස්තු					368,000		**1,426,000**
එකතුව		**-**	**-**	**-**	**368,000**	**-**	**1,426,000**

සටහන **-36**

ඩිප්ලෝමා පාඨමාලා වියදම්- NVQ	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
බාහිර කථිකාචාර්ය දීමනා		-			339,618	339,618	**858,778**
අනෙකුත් වියදම්		-				-	**280,796**
Assessment Fees					1,170,697	1,170,697	**-**
එකතුව		**-**	**-**	**-**	**1,510,315**	**1,510,315**	**1,139,574**

සටහන -37

තාක්ෂණ විෂයය ඉගැන්වීම-පාසැල්	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය						-	-
ඉගැන්වීමේ දීමනා		-				-	-
අනෙකුත් පුනරාවර්තන වියදම්	23	-				-	-
						-	-
එකතුව		-	-		-	-	-

සටහන -38

නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් (SSDP)		රු. 2021	රු. 2020			රු. 2021	රු. 2020
	සට:	එකතුව	එකතුව	ශ්‍රීලංජපුඅා	සට:	එකතුව	එකතුව
කාර්යය සාධන දීමනා	PL	13,611,651	**12,461,800**		23 E	13,612,050.00	**12,461,800**
තත්ත්ව කළමනාකරණ පද්ධතිය	PL	-	**-**			-	**-**
විෂයමාලා සංවර්ධනය	PL	1,133,681	**-**		23 A	1,133,581	**-**
සෙල් මෙම්බර් දීමනාව	PL	697,168	**391,005**		23 E	696,968	**391,005**
කොන්ත්‍රාත් උපදේශක දීමනාව	PL	-	**6,042,500**			-	**6,015,043**
සමාජ අලෙවිකරණය	PL	-	**-**			-	**-**
දිරි දීමනා ගෙවීම් - ශ්‍රීලංජපුඅා	PL	2,344,849	**1,910,670**		23E	2,344,849	**1,910,670**
එච්.ආර්.ඩී දීමනාව		81,600	**-**		23E	81,600	**-**
ප්‍රාග්ධන වියදම්		-	**637,300**			-	**637,300**
තැන්පතු මුදල ආපසු ගෙවීම්		-	**-**			-	**-**
එකතුව		**17,868,950**	**21,443,275**			**17,869,049**	**21,415,818**

සටහන -39

ජංගම ගිණුම්	සට:					රු. 2021	රු. 2020
						එකතුව	එකතුව
අර්ධ කාලීන						(132,090,106)	**121,677,669**
අර්ධ කාලීන -ලංජකාඅඅා						132,090,106	**(121,677,669)**
ලංජකාඅඅා සමග ශ්‍රීලංජපුඅා ගිණුම						-	**56,410,670**
ශ්‍රීලංජපුඅා සමග ලංජකාඅඅා ගිණුම						-	**(56,410,670)**
ශ්‍රීලංජපුඅා සමග නයටා ගිණුම						-	**129,168,821**
එකතුව		-	-	-	-	**(0)**	**129,168,821**

සටහන -40

ලැබිය යුතු/ ගෙවිය යුතු	සට:					රු. 2021	රු. 2020
						එකතුව	එකතුව
ලැබිය යුතු MTTC දීමනා							
ගෙවිය යුතු MTTC දීමනා							
ලැබිය යුතු විදුලි වියදම්							
ගෙවිය යුතු විදුලි වියදම්							
එකතුව		-	-	-	-	-	-

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
ආධුනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	රු.	රු.
වත්කම්	**2021**	**2020**
ජංගම වත්කම්		
බැංකු ශේෂය	3,209,777	3,664,911
ලැබිය යුතු වාරික ආදායම	152,075	8,800
ලැබිය යුතු පොලී	201,435	212,594
ස්ථාවර වත්කම්		
ආයෝජන		
ස්ථාවර තැන්පතු	9,684,331	9,240,052
මුළු වත්කම්	**13,247,618**	**13,126,357**
වගකීම්		
රක්ෂණ ගෙවීම්		
ශුද්ධ වත්කම්	13,247,618	13,126,357
සමුච්චිත අරමුදල	13,126,357	12,405,024
එකතුකලා- අතිරික්තය	121,261	721,333
මුළු වගකීම්	**13,247,618**	**13,126,357**

අධ්‍යක්ෂ-විදුහල්පති
ලංජකාඅඅා

ගණකාධිකාරී
ලංජකාඅඅා

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
ආධුනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

	රු.	රු.
	2020	**2021**
ආදායම්		
වාරික ආදායම්	152,075	326,700
පොලී ආදායම්	558,377	715,633
එකතුව	**710,452**	**1,042,333**
වියදම්		
ආරක්ෂිත අයිතම්	250,170	243,000
මුව ආවරණ	337,500	78,000
බැංකු ගාස්තු	1,521	
එකතුව	**589,191**	**321,000**
අතිරික්තය	**121,261**	**721,333**
පෙර වර්ෂයේ ගැලපුම්		
අතිරික්තය	**121,261**	**721,333**

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
ආධුනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

විස්තරය	සටහන	2021 (රු.)	2020 (රු.)
මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහය			
මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය/ඌණතාවය		121,261	721,333
ඉකුත් වර්ෂයේ ගැලපීම්		(558,377)	(715,633)
		(437,116)	5,700
මුදල්මය නොවන ගනුදෙනු			
උපචිත වියදම් වැඩිවීම/අඩුවීම			
සමුච්චිත වියදම් වැඩිවීම/අඩුවීම			
ජංගම වගකීම් වැඩිවීම/අඩුවීම			
ජංගම වත්කම් වැඩිවීම/අඩුවීම		(132,116)	253,181
මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		(569,232)	258,881
ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහය			
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම		-	-
		(569,232)	258,881
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය			
ස්ථාවර තැම්පතු පොලි		558,377	715,633
ආයෝජන වැඩිවීම/අඩුවීම		(444,279)	(635,267)
		(455,134)	339,247
කාලපරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		3,664,911	3,325,664
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		**3,209,777**	**3,664,911**

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

ආධුනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය

	රු.	රු.
	සමුච්චිත අරමුදල	මුළු වටිනාකම
ආරම්භක ශේෂය 01.01.2021 පෙර වර්ෂයේ ගැලපුම්	11,122,934	11,122,934
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය	1,282,090	1,282,090
අඩුකිරීම් :	12,405,024	12,405,024
2021.12.31 දිනට ශේෂය	**12,405,024**	**12,405,024**

1.පොදු තොරතුරු

1.1 ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය 2017 අංක 15 දරණ පනතින් පිහිටුවන ලද කාර්මික පුහුණු ආයතනයකි.

1.2 ගිණුම් කාල සීමාව

2021 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වන මාස 12 ක කාල පරිච්ඡේදයකි.

1. ගිණුම් පිළියෙල කිරීමේ පදනම

1.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් ඉදිරිපත් කර ඇති රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත වලට අනුකූල ලෙස ආයතනයේ ගිණුම් ප්‍රකාශන පිළියෙල කරන ලදි.

ගිණුම් ප්‍රකාශන වල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, අරමුදල් හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් ඇතුලත්ය.

1.2 අඛණ්ඩ පැවැත්ම

ආයතනයට අඛණ්ඩ පැවැත්මක් ඇති බව සලකා ගිණුම් ප්‍රකාශන පිළියෙල කර ඇත.

1.3 මිණුම් කිරීමේ පදනම

අදාල සටහන් වලින් විශේෂයෙන් හෙලිදරව් කර නොමැති අවස්ථා වලදී මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම් කර පිළියෙල කර ඇත.

ඉඩම් හා ගොඩනැගිලි 2013 වසරේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රත්‍යාගණනය කර ඇත. එලෙසම වාහන 2014 වසරේදී ප්‍රත්‍යාගණනය කරන ලදි. 2014 වසරේදී රු.1,899,262.00 ක වටිනාකමට පුස්තකාල පොත් තක්සේරු කර ගිණුම්වලට ගැනීමට කටයුතු කරන ලදි.

1.4 ක්ෂය කිරීම

මිලදීගත් මස සිට ස්ථාවර වත්කම් ක්ෂය කරනු ලැබේ. ආයතනයේ වාර්ෂික ක්ෂය කිරීමේ අනුපාතයන් පහතින් සඳහන් කර ඇත.

	වාර්ෂික අනුපාතය
ගොඩනැගිලි	10%
මෝටර් රථ වාහන	25%
යන්ත්‍ර හා පුහුණු උපකරණ	12.5%
ලීබඩු උපකරණ	10%
කාර්යාල උපකරණ	25%
අනෙකුත් උපකරණ	25%
පුස්තකාල පොත්	25%

ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ වාර්ෂික ක්ෂය කිරීමේ අනුපාතයන් පහතින් සඳහන් කර ඇත.

ගොඩනැගිලි	5%
ලීබඩු හා සවිකිරීම් හා කාර්යාල උපකරණ	10%
Plant හා යන්ත්‍ර හා පුහුණු උපකරණ	10%
පරිගණක හා උපාංග	25%

ජංගම වත්කම්

ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් හෝ ඊට අඩු කාලයක් පවතින වත්කම් ජංගම වත්කම් ලෙස වර්ග කර ඇත. තොගය පෙර ලැබීම් පෙර නිකුතු ක්‍රමයට අගය කර ඇත.

2.5 විදේශ මුදල් ගණුදෙනු

විදේශ මුදලින් සිදු කරන ගණුදෙනු වලදී ගණුදෙනු සිදුවූ දිනට පැවති විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කර ගිණුම් ප්‍රකාශවල පෙන්වනු ඇත.

2.6 ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන ගණුදෙනු

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සියලු ප්‍රමාණාත්මක ගණුදෙනු ගිණුම් ප්‍රකාශන සඳහා අදාල කරගනු ලැබේ.

2. වගකීම් හා වෙන්කිරීම්

3.1 ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීමේදී හඳුනාගත් සියලු වගකීම් ගිණුම්ගත කර ඇත. එලෙසම විය හැකි වගකීම් සඳහා ප්‍රමාණාත්මක වෙන් කිරීමක් සිදු කර ඇත.

3.2 විශ්‍රාම පාරිතෝෂික

ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීමේදී 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව, විශ්‍රාම පාරිතෝෂික වෙන් කිරීම සිදු කරනු ලැබේ.එලෙසම ශ්‍රීලංගම ජනතාකරණය කරන අවස්ථාවේදී සේවයේ යෙදී සිටි (1990/12/28) සේවකයින් සඳහා 1994 අංක 21 දරණ ශ්‍රීලංගම පාලක මණ්ඩල පත්‍රිකා අංක 21 අනුව සේවය කල වසරකට අමතර සති 02 ක පාරිතෝෂික වෙන් කරනු ලැබේ.

3.3 විලම්භීත ආදායම්

භාණ්ඩාගාර ලැබෙන ප්‍රාග්ධන ප්‍රතිපාදන විලම්භීත ආදායම ලෙස ගිණුම්ගත කර ඇත. මෙම වටිනාකම වාර්ෂික ක්ෂය ප්‍රමාණය මත කපා හරිනු ලැබේ.

3.4 සේවක අර්ථ සාධක අයකිරීම්

සේවක අර්ථසාධක අරමුදල සඳහා ආයතනයෙන් දායකත්වය 12% කි. සේවක දායක මුදල 08% කි. එලෙසම ශ්‍රීලංගම පත්වීම්ලාභී සේවක දායක මුදල 10% කි. සේවක අර්ථසාධක අරමුදල සඳහා SLGTI ආයතනයේ දායකත්වය 15% වන අතර සේවක දායකත්වය 10% කි.

3. සංචිත

සමුච්චිත අරමුදල් 2005 ට පෙර ශ්‍රී ලංගමයේ පාලන කාලය තුළ එහි සියලුම වත්කම්වල ණය ශේෂය නියෝජනය කරයි. ප්‍රාග්ධන සංචිත රුපියල් 4,407,578.00 යනු 2005 වර්ෂයේදී රජයෙන් වෙන් කර ඇති ප්‍රාග්ධන අරමුදල් වේ.

4. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය (CGTTI) ප්‍රධාන කාර්යාලය සහ CGTTI – බොරැල්ල ශාඛාව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට (ශ්‍රී ලංගම) අයත් ඉඩම්වල පිහිටා ඇත. ලංගමයේ අයිතිය ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය වෙත පැවරීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

5. සංසන්දනාත්මක අගයන්

ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ (SLGTI) පරිපාලන හා මූල්‍ය කටයුතු ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට (CGTTI) පැවරීමට 2021 ජනවාරි 09 වැනි දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව, 2020 මුදල් වර්ෂය සඳහා ආයතන දෙකෙහිම මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර එක් ගිණුම්කරණ ආයතනයක් ලෙස ඉදිරිපත් කර ඇත.

කෙසේ වෙතත්, පෙර වසරේ (2019) සංසන්දනාත්මක සංඛ්‍යාවලට ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය සම්බන්ධ සංඛ්‍යා පමණක් ඇතුළත් වේ (ඉහත සඳහන් කළ අනුමැතිය මුල්‍ය වර්ෂය තුළ ලබා දී ඇති බැවින්. එනම් 2021 ජනවාරි 09 වැනි දින SLGTI ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) යටතේ ක්‍රියාත්මක විය. 2019 දක්වා.

6. රේඛීය අමාත්‍යාංශයෙන් ලැබුණු පුනරාවර්තන ප්‍රදාන රු. 15 සටහන යටතේ ඇතුලත් කර ඇති රු. මෙම මුදල සිවිල් නඩත්තුව යටතේ සටහන 22 යටතේ ඇතුළත් වේ.

7. අමතර කොටස් තොගවල ශුද්ධ යථාර්ථවාදී අගය (NRV) 2020 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා ඇත. පිරිවැය සහ (NRV) අතර වෙනස 2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට කපා හරිනු ලැබේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එස්වයිඒ/බී/සිජීවිටිඅයි/1/21 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2022 මැයි31 දින

සභාපති
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර නිබුණු පිරිවැය රු. 464,077,703 ක් වූ වත්කම් වර්ග 05 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 සිට 2020 දක්වා කාලය තුළ කිලිනොච්චි ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය හා ජාතික ආධුනිකත්ව පුහුණු කිරීමේ අධිකාරිය අතර සිදුවූ ගනුදෙනු සඳහා පවත්වාගෙන ගිය රු. 129,168,821 ක් වූ ජංගම ගිණුමේ ශේෂය, කිලිනොච්චි ආයතනය ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට පවරා ගැනීමෙන් පසුව ගිණුම් ශේෂයන් ගලපා සැසඳීමට කටයුතු නොකර එම ශේෂය ආයතනයේ මූල්‍ය නත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස දක්වා නිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය කොටසේ (අ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 13.3 ඡේදය.	වැඩබැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරනතෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. තනතුරට පූර්ණ කාලීන නිලධාරියකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්කිරීමක් නොපමාව කළ යුතු වුවත්, ආයතනයේ අධ්‍යක්ෂ විදුහල්පති තනතුර සඳහා ස්ථිර පදනමින් නිලධාරියකු පත්කර ගැනීම සඳහා ආයතනය ප්‍රමාණවත් පියවර නොගෙන පාලක මණ්ඩල සාමාජිකයකු 2020 පෙබරවාරි 18 දින සිට පත්කර තිබුණි.
(ආ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය	භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ආයතනයේ නිලධාරීන්ට කිසිදු දීමනාවක් නොගෙවිය යුතු බව පැහැදිලිව දක්වා තිබියදී 2021 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අන්තර්ජාලය මඟින් දේශන පැවැත්වීම වෙනුවෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මාසිකව රු. 2000 බැගින් 2021 වර්ෂයේ එකතුව රු. 1,634,000 ක් ගෙවා තිබුණි.
(ඇ) 2018 ජූලි 17 දිනැති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 38 (1) (ඇ) ඡේදය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙළ කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්තිත්වයන්ට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වග බලාගත යුතු වුවත්, 2018 හා 2019 වර්ෂවල වාර්ෂික වාර්තා මෙතෙක් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පසුගිය වසර 05 ක කාලය තුළ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ඉල්ලුම් වාර්ෂිකව ඉහළ ගියද, වැඩිවන ඉල්ලුමට සාපේක්ෂව පාඨමාලා සඳහා බඳවා ගැනීම් ඉහළ දැමීමට 2016 වසරේ සිට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. පූර්ණ කාලීන පාඨමාලා සඳහා බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 20 ටත් අඩු මට්ටමක පවතින අතර බඳවාගත් සිසුන් සංඛ්‍යාව වසර 05 ක් තිස්සේ 600 ක් වැනි ස්ථාවර අගයක පැවතුණි. එමෙන්ම කිලිනොච්චි පුහුණු මධ්‍යස්ථානයේ 2017 වර්ෂයේ සිට සිසුන් බඳවා ගැනීම් 270 ක් පමණ වන බවත්, මේ වන විට මධ්‍යස්ථානය ආරම්භ කර වර්ෂ 05 ක් පමණ ගතවී ඇතත් ශිෂ්‍ය බඳවා ගැනීමේ සීමා වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනතේ 4 (ඌ) වගන්තිය අනුව කලාපීය පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහා 2021 අප්‍රේල් 06 දින පැවති පාලක මණ්ඩල රැස්වීම් තීරණ අනුව මඩකලපුව ප්‍රදේශයේ කලාපීය පුහුණු මධ්‍යස්ථානයක් ඇරඹීම සඳහා සාකච්ඡා කර තිබුණද, මේ සම්බන්ධව කිසිදු ඉදිරි පියවරක් ගෙන නොතිබුණි. 2021 වර්ෂයේ අළුතෙන් ආරම්භ කර තිබූ ආණමඩුව පුහුණු මධ්‍යස්ථානයේද එක් පාඨමාලාවක් පමණක් ආරම්භ කර ඇති අතර එහි ශිෂ්‍ය සහභාගිත්ව සංඛ්‍යාව 67 ක් බව නිරීක්ෂණය විය.

(ඇ) 2016 වර්ෂයේ බොරැල්ල පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලා 02 ක් සහ පදනම් පාඨමාලාවක් සඳහා සිසුන් 147 දෙනෙකු පුහුණුව ලබමින් සිටි නමුත් වර්තමානය වන විට එක් පාඨමාලාවක් පමණක් පවත්වාගෙන යනු ලබන අතර ශිෂ්‍ය සංඛ්‍යාවද 44 ක් වැනි අඩු අගයක්ව පැවතුණි. එමෙන්ම කිලිනොච්චි පුහුණු මධ්‍යස්ථානයේ කෘෂිකාර්මික උපකරණ අළුත්වැඩියා කිරීමේ පාඨමාලාවක් ආරම්භ කිරීමට 2021 අප්‍රේල් 09 දින පාලක මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණද 2022 ජනවාරි 31 දින වන විටත් අදාල පාඨමාලාව ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අවසාන විභාගයට පෙනී සිට සමත් වූ සහතික පත්‍ර ලබාදී නොතිබුණු සිසුන් සංඛ්‍යාව සියයට 27 සිට සියයට 61 දක්වා ඉහළ ප්‍රතිශතයක් වී තිබුණු අතර අදාල සිසුන් හට සහතික පත්‍ර ලබාදීම සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් කළමනාකරණය විසින් සකස් කර නොතිබුණි.

(ඉ) ආයතනය සතු අධ්‍යක්ෂ/විදුහල්පති නිල නිවසේ ආයතනයේ නිලධාරියකු නොවන කර්මාන්ත අමාත්‍යාංශයට අයත් අතිරේක ලේකම්වරයකු 2019 දෙසැම්බර් 27 දින තෙක් පදිංචිව සිටි අතර එදින සිට මේ දක්වා මෙම නිල නිවසේ කිසිදු නිලධාරියකු භාවිතයට ගෙන නොතිබුණි. 2020 හා 2021 වර්ෂයේදී නිල නිවසේ ආරක්ෂක කටයුතු වෙනුවෙන් එකතුව රු. 1,428,610 ක් ප්‍රයෝජනයට නොගන්නා නිල නිවස වෙනුවෙන් ආයතනය විසින් ගෙවීම් සිදුකර තිබුණි.

(ඊ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ වාහන අළුත්වැඩියා අංශයේ වැඩ බිම සැකසීම සඳහා ආයතනයේ ඉංජිනේරු විසින් පිළියෙළ කළ ඇස්තමේන්තුව ඉක්මවා රු. 1,218,922 ක් පෞද්ගලික ආයතනයට ගෙවීම් කර තිබුණු අතර, එම කොන්ත්‍රාත්තුවට අදාල අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය ප්‍රතික්ෂේප කිරීමට හේතුවූ සාධක තහවුරු කර ගැනීමට අදාල ලිපි ලේඛන ලිපිගොනුව තුළ අන්තර්ගත නොකර දෙවන අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබීම හේතුවෙන් ආයතනයට රු. 1,196,022 ක පාඩුවක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

(උ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඇස්තමේන්තු කර අනුමැතිය ලබාගෙන තිබූ එකතු වටිනාකම රු. මිලියන 47.2 වූ ක්‍රියාකාරකම් 12 ක් වැඩ ආරම්භ නොකර නවතා දමා තිබුණු අතර, රු. මිලියන 12 ක් ඇස්තමේන්තු කර තිබූ ක්‍රියාකාරකම් 02 ක් සඳහා වැයකර තිබූ මුදල රු.මිලියන 1.831 කි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 20 ට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ඌ) වර්ෂ 10 කට වඩා පැරණි එකතුව රු. 1,407,197 ක් වූ ණයගැති ශේෂයන් සහ වර්ෂ 05 ත් 10 ත් අතර එකතුව රු. 932,436 ක් වූ ශේෂයන් අයකර ගැනීමට හෝ මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව අනුමැතිය ලබාගෙන පොත්වලින කපාහැරීම සඳහා හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(එ) පුරප්පාඩු වී ඇති ප්‍රධාන තනතුරු පහට අදාළව අධ්‍යාපන සුදුසුකම් වලට සම වැටුප්තල සකස් කර ඒ පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර එම පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමට හා ආයතනයේ සේවක තනතුරු ප්‍රති ව්‍යුහගත කිරීමේදී වැටුප් වර්ධක සම්බන්ධයෙන් ඇති වූ ගැටලු සහගත තත්ත්වයන් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිවැරදි කර ගැනීමට 2019 මැයි 23 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභා රැස්වීමේදී ගෙන තිබූ එම තීරණයන් 2021 දෙසැම්බර් 31 දින තෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන
1.1. තත්ත්වාගණනය කළ මතය
1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මේ වන විට මෙම වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා කමිටුවක් පත්කර එම කාර්යයෙහි 25% පමණ කොටසක් අවසන් කර තිබේ.

2022 වර්ෂය තුළදී අදාළ කාර්යය නිමකර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව වාර්ෂික ගිණුම් වල එම වටිනාකම් ඇතුළත්කර 2022 ගිණුම් වාර්තා පිළියෙල කර ඉදිරිපත් කරන බව සඳහන් කරමි.

(ආ) කිලිනොච්චි ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය හා ජාතික ආධුනිකත්ව පුහුණු කිරීම් අධිකාරිය යටතේ පැවති කාලපරිච්ඡේදය තුළ එම ආයතනය සමඟ සිදුකළ ගනුදෙනු සඳහා විමසුමෙහි සඳහන් පාලන ගිණුම පවත්වාගෙන යන ලදි. ජාතික ආධුනිකත්ව පුහුණු ආයතනය හරහා ලබා දී ඇති රාජ්‍ය අරමුදල් වටිනාකම් මෙම පාලන ගිණුමේ ශේෂය තුළ ප්‍රධාන වශයෙන් අන්තර්ගත වේ.

කිලිනොච්චි ලංකා ජර්මන් අභ්‍යාස ආයතනය සහ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය කටුබැද්ද ආයතනය වෙත පැවරීමේ ක්‍රියාවලියට සම්බන්ධව ඇතැම් කටයුතු තවදුරටත් අවසන් වී නොමැති බැවින් එම කාර්යයන් අවසන් වූ වහාම අදාළ පාලන ගිණුම් ශේෂය ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමඟ සංසන්දනය කර මෙම ගිණුම් ශේෂය නිසි අනුමැතිය සහිතව කපා හැරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි.

තවද කිලිනොච්චිය ලංකා ජර්මන් පුහුණු ආයතනයේ සියළු වත්කම්, වගකීම් 2021 අවසන් මූල්‍ය පුකාශන තුළ ඉදිරිපත් කර ඇත. එමෙන්ම, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමඟ අදාළ ගිණුමේ අවසන් වගකීම් වටිනාකම තහවුරු කර ගෙවියයුතු මුදල් නිරවුල් කළ යුතුය. උක්ත කරුණු පදනම් කරගෙන රු. 129,168.82 ක වටිනාකම 2021 අවසන් මූල්‍ය ප්‍රකාශ තුළ සඳහන් කර ඇති අතර එමඟින් ජංගම වගකීම් අධිතක්සේරු වී නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.

1.3.ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු
1.4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්.
1.5 විගණනය සම්බන්ධයෙන් විගණගේ වගකීම.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

<u>නීතිරීති / විධානයට යොමුව</u> **<u>නිරීක්ෂණ</u>**

(අ) <u>අධ්‍යක්ෂ - විදුහල්පති</u>

මෙම පුරප්පාඩුව පිරවීමට අදාළ පුවත්පත් දැන්වීම 2022.06.24 දින පලකර ඇත.

(ආ) 2020 වසර සිට ආරම්භ වූ කොරෝනා වසංගත තත්වය නිසා අධ්‍යාපන ආයතන ඇතුලුව සියලු රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අධ්‍යයන එක දිගට මාස ගණන් වසා තැබීමට සිදු විය.

පසුකාලීනවද අධ්‍යාපන ආයතන විවෘත කල ද සියලුම සිසුන් පාඨමාලා සඳහා කැඳවීමට නොහැකි තත්වයක් පැවතිය. මෙම වාතාවරණය තුල රජය විසින් රාජ්‍ය ආයතනවල කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම පිණිස මාර්ගගත ක්‍රම භාවිතා කිරීමට උනන්දු කරවීය. එලෙසම 2020 වසර ඉදිරි කාල සඳහා අයවැය ලේඛන පිළියෙල කිරීමේදී ද මේ සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලෙස උපදෙස් ලබා දී තිබුණි.

අප ආයතනයේ පූර්ණ කාලීන සිසුන් 2400 ක් පමණ ඉගෙනුම් ලබයි. මෙම සිසුන්ගේ පාඨමාලා කාලය වසර 04 ක් වේ. සිසුන්ගේ අධ්‍යාපන කටයුතු අතරමඟ නතර කිරීම නිසා ඔවුනට සිදුවන පාඩුව මඟහරවා ගැනීම සඳහා ආයතනයේ ඉගෙනුම් කාර්ය මණ්ඩලය ඉතා කැපවීමෙන් මාර්ගගත ක්‍රමයට පාඨමාලා පැවැත්වූ නිලධාරීන්ට පාලන මණ්ඩල අනුමැතියෙන් මසකට රු.2000.00 බැගින් පාඨමාලා පැවැත්වූ මාස සඳහා පමණක් දීමනාවක් ගෙවා ඇත.

(ඇ) 2018 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අමාත්‍යාංශය වෙත 2022.08.03 දින ඉදිරිපත් කර ඇති අතර 2019 වාර්ෂික වාර්තාද කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

2.3. වෙනත් කරුණු

(අ). ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පසුගිය වර්ෂ 05ක කාලය තුළ මොරටුව ශාඛාවේ පූර්ණකාලීන පාඨමාලා ඉල්ලුම ඉහළ ගිය නමුත් දැනට ඇති භෞතික සම්පත් හා ඉඩ පහසුකම් වර්ෂයකට සිසුන් 600 කට පමණක් ප්‍රමාණවත් වේ. එම ප්‍රමාණය වැඩිකර ගැනීමට නාගරික සංවර්ධන අධිකාරියට අයත් ආයතනයට යාබද අක්කර 04 ක භූමිභාගය ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර තවම ඒ පිළිබඳ සතුටුදායක තත්වයක් නොමැත. එමෙන්ම ආයතනය ඉදිරිපිට ඇති ශ්‍රී ලංගමට අයත් ගාලු පාර අයිනේ පිහිටි ඉඩම් කොටස ඉල්ලා සිටියද මේ දක්වා විසඳුමක් ලබාගැනීමට නොහැකි වී ඇත.

ඉහත කාරණාවලට විකල්පයක් ලෙස බොරැල්ල කලාපීය මධ්‍යස්ථානය සහ ආණමඩුව කලාපීය මධ්‍යස්ථානය පිහිටුවා අතිරික්ත ඉල්ලුම්කරුවන් හට අවස්ථාව ලබාදීමට කටයුතු කරන ලදී.

අමාත්‍යාංශයෙන් ලද උපදෙස් මත අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිල ගුරුපුහුණු මධ්‍යස්ථානය තුල කලාපීය මධ්‍යස්ථානයක් සඳහා සැලසුම් සකස් කලද එම භූමිය ලබාගැනීමේදි මතුවූ ගැටළු හේතුවෙන් තාවකාලිකව නවතා දැමීමට සිදුවිය. නමුත් විකල්පයක් ලෙස බිබිල මැදගම පිහිටි කාර්මික විද්‍යාලය තුල ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ කලාපීය මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා භූමි පරීක්ෂණයක් 2022 පෙබරවාරි මස 10 දින සිදුකර ඇත. ඒ පිළිබඳව ව්‍යාපෘති වර්තාවක් මේ දිනවල සකස් කරමින් පවතී.

ඊට අමතරව පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා සහභාගී කරගැනීමට නොහැකි වූ දරුවන් සඳහා අර්ධකාලීන පාඨමාලාවලට සහභාගී වීමට අවස්ථාව සැලසීම හා තෝරාගැනීමේදී ප්‍රමුඛත්වයක් ලබාදෙන ලදී. ඒ අනුව වසරකට සිසුන් 4000 ක් පමණ පුහුණුව ලබයි.

වසර දෙකක පටන් කොරෝනා වසංගත තත්වය හේතුවෙන් ආයතනීය දින දර්ශනයට අනුව සැලසුම් කරන ලද කාලසීමාවේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මොරටුව පරිශ්‍රය සඳහා 2021 වර්ෂයේ ආධුනික කණ්ඩායම බඳවා ගැනීම ප්‍රමාද වූ නමුත් පසුගිය ජනවාරි මස 23 යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වූ අතර මෙම වසරේ අප්‍රේල් මස බඳවා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.

කොවිඩ් වසංගත තත්වය හමුවේ වුවද අපගේ පාඨමාලාවල සෛද්ධාන්තික හා අදාල සෛද්ධාන්තික කොටස් මාර්ගගතව පවත්වාගෙන ගිය අතර 2020 මැයි මස 09 දා පටන් 2020 අගොස්තු 06 දක්වා මාර්ගගත පන්ති 236 ක් පමණද 2020 ඔක්තෝබර් 19 දා සිට 2021 පෙබරවාරි දක්වා මාර්ගගත පන්ති 650ක් පමණද 2021 අප්‍රේල් 27 දා සිට 2021 දෙසැම්බර් 01 දා දක්වා මාර්ගගත පන්ති 4200 ක් පමණද වේ. ඉතිරිව තිබූ ප්‍රායෝගික කොටස් ඉගැන්වීම සඳහා කාලය කලමනාකරණය කරගැනීමට තිබූ අවශ්‍යතාවය හේතුකොට ගෙන 2021 නව බඳවා ගැනීම පමාවීමට හේතුවක් වූ බවද දන්වමි.

(ආ) 2017 අංක 15 දරණ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පනතේ 4 (ඌ) වගන්තිය අනුව කලාපීය මධ්‍යස්ථාන දෙකක් මේ වන විට ආරම්භ කර ඇති අතර 2020 වර්ෂයේ බොරැල්ල කලාපීය මධ්‍යස්ථානයත් 2021 වර්ෂයේ ආණමඩුව කලාපීය මධ්‍යස්ථානයත් ආරම්භ කරන ලදී. මොනරාගල ප්‍රදේශයේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ කලාපීය මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා මේ වන විට සැලසුම් සකස් කරමින් පවතී.

(ඇ) බොරැල්ල පුහුණු මධ්‍යස්ථානය 2015 වසරේ දී වසා දමා තිබූ අතර එහි පුහුණුව ලබමින් සිටි ආධුනික ආධුනිකාවන් ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය තුල පිහිටුවන ලද වාහන බොඩි පින්තාරු සහ අළුත්වැඩියා අංශයට යොමු කරන ලදී. වසර 03 ක පමණ කාලයක් වසා දමා තිබූ බොරැල්ල පුහුණු මධ්‍යස්ථානය ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ බොරැල්ල කලාපීය මධ්‍යස්ථානය ලෙස 2021 වසරේ අළුත්වැඩියා කිරීමෙන් පසු ත්‍රීරෝද රථ කාර්මික ශිල්පී පාඨමාලාව ආරම්භ කරන ලදී. මේ වන විට කණ්ඩායම් දෙකක් බඳවා ගෙන ඇති අතර 2020 වසරේ පළමු කණ්ඩායමත් 2021 වසරේ දෙවන කණ්ඩායමත් ලෙස බඳවා ගෙන පුහුණු කිරීමේ කටයුතු පවත්වාගෙන යනු ලබයි. 2022 වසරේ බොරැල්ල කලාපීය මධ්‍යස්ථානයට බඳවා ගැනීම පුළුල් කිරීමට කටයුතු සම්පාදනය කරමින් පවතී.

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ බොරැල්ල කලාපීය මධ්‍යස්ථානයට බඳවා ගන්නා ලද මුල් කණ්ඩායම් දෙක සඳහා තවමත් පුහුණුවීම් කටයුතු කරමින් පවතින අතර පුහුණුව අවසන් කිරීමෙන් පසු රැකියාගත කිරීම සඳහා සී.ස. ඩේවිඩ් පීරිස් මෝටර් සමාගම කැමැත්ත ප්‍රකාශ කොට ඇත. ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව තුල ත්‍රීරෝද රථ කාර්මික ශිල්පී පාඨමාලාව හදාරන සිසුන්ට ලබාගත හැකි උපරිම මට්ටම 4 වන මට්ටම වන අතර ඊට එහා ගිය සුදුසුකම් ලබාගැනීමට සුදුසු පාඨමාලාවක් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුන්වාදී නොමැත.

(ඇ) 2017 වර්ෂයේ බඳවාගත් සිසුන්ගේ අවසාන වෘත්තීය පරීක්ෂණය 2020නොවැම්බර් 2021 ,අගෝස්තු සහ 2022 පෙබරවාරි මාසවලදී පවත්වන ලදී .මෙහිදී 2021අගෝස්තු මස පවත්වන ලද අවසාන වෘත්තීය පරීක්ෂණය සමත් සිසුන්ට සහතිකපත්‍ර නිකුත් කිරීම සිදුවන අතර 2022 ,පෙබරවාරි පවත්වන ලද විභාගයේ ප්‍රතිඵල නිකුත් වූයේ 2022මැයි මස 10වන දිනවේ .එබැවින් දැනට නිකුත් නොකර ඇත්තේ එම සහතිකපත්‍ර පමණි.

මෙම ආයතනයේ ලේඛකාධිකාරී ආවරණ (තනතුරෙහි රාජකාරී කටයුතු ආවරණය කරමින් සිටි නිලධාරී මහතා 2022 මැයි මස 09දින සිට එම තනතුරෙන් ඉල්ලා අස්වූ බැවින් ,ලේඛකාධිකාරී තනතුරෙහි පුරප්පාඩු පිරවූ වහාම එම සහකිතපත්‍රද නිකුත් කිරීමට හැකියාව ලැබේ .එම සහතිකපත්‍ර මේ වනවිට මුද්‍රණය කරමින් පවතින අතර දැනට TVEC ආයතනයේ නිකුත් කර ඇති සියළුම NVQ සහතිකපත්‍ර මේ වනවිට සියළු අත්සන් සහිතව සිසුන් වෙත නිකුත් කර ඇති බව මෙයින් දන්වමි.

(ඉ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අමාත්‍යතුමාගෙන් එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එස්. බාල සුබ්‍රමනියම් මහතා කර තිබූ ඉල්ලීමක් අනුව, රේඛීය අමාත්‍යාංශය භාර අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණලේකම්ගේ දැනුම්දීම පරිදි මෙම නිල නිවස 2015 දෙසැම්බර් මස සිට අදාල නිලධාරියාට ලබා දී තිබූ අතර, 2019.12.27 දින නැවත එය ආයතනය වෙත භාර දී ඇත. ඉන් අනතුරුව ස්ථිර පදනමින් අධ්‍යක්ෂ - විදුහල්පතිවරයකු ආයතනයේ නොසිටීම හේතුවෙන් මෙම නිල නිවස භාවිතයට නොගන්නා ලදී.

නිලධාරියකු වාසය නොකලද ආයතනය සතු දේපලක් වන මෙහි ආරක්ෂාව සඳහා කටයුතු කල යුතු බැවින්, පුද්ගලික ආරක්ෂක නිලධාරියකු යෙදවීමට සිදු වූ අතර ඒ වෙනුවෙන් අදාල ආරක්ෂක ආයතනයට මුදල් ගෙවීමට සිදු වුනි.

(ඊ) මෙම කාර්යය සම්බන්ධව ඉංජිනේරු ඇස්තමේන්තුව රු) 8,363,600.00 .බදු රහිත (වන අතර ගෙවීම් සඳහා නිර්දේශිත මුදල 9,163,000.25බව දන්වමි .

ඒ අනුව මිල විචලනය 9.56% කි. ගෙවීම් කරන ලද මුදල ඇස්තමේන්තුකල වටිනාකමට වඩා 10% කට අඩු අගයක් වේ.

විගණන විමසුමේ 1.2 මඟින් විමසා ඇති කරුණ සම්බන්ධයෙන් මේ පිළිබඳව සවිස්තරාත්මකව අදාළ පැහැදිලි කිරීම ඉදිරිපත් කර ඇත .

ආයතන විසින් ඉදිරිපත් කරන ලද පිරිවිතර සලකා බලන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව අවම මිල ඉදිරිපත් කළ Kalhara Builders ආයතනය ලංසු ලේඛනයේ දක්වා ඇති Polysulphide Sealant කාර්යය සඳහා නොගැලපෙන බව තහවුරු කර ගැනිමෙන් අනතුරුව Finex Engineering (pvt) Ltd ආයතනය වෙත කොන්ත්‍රාත්තුව පැවරීම සඳහා නිර්දේශ කර ඇත.

ඒ අනුව අවම මිල ඉදිරිපත් කළ ආයතනය තෝරා නොගැනීමට හේතු තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ සවිස්තරාත්මකව දක්වා ඇත .මෙම ලේඛණ විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

(උ) සමාලෝචිත කාල පරිච්ඡේදයේ අනපේක්ෂිත ලෙස ව්‍යාප්ත වූ කොවිඩ් වසංගතය හේතුකොට ගෙන ආයතනය වසා තැබීම ආයතනය ආරම්භ කළද සේවකයින් සිටින සංඛ්‍යාව සේවයට කැඳවීම මෙන්ම රජය විසින් ප්‍රසම්පාදන කාර්යයන් වහාම අත්හිටුවන ලෙස නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට සිදුවීම වැනි ආයතනීය කළමණාකාරිත්වයේ පාලනයට පරිභාරව සිදු වූ කරුණුමත ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. එහි ඇතුලත්ව තිබූ ක්‍රියාකාරකම් 2022 වසර ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට පියවර ගන්නා ලදි.

(ඌ) ලැබිය යුතු ණයගැතියන්ගෙන් විශාල ප්‍රමාණයක් ශ්‍රී.ලං.ග.ම. බස්රථ අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් අය විය යුතු මුදල් බව දන්වා සිටිමි.

සිහි කැඳවීම් ලිපි මගින් සහ දුරකථන ඇමතුම් හරහා අදාල නිලධාරීන් වෙත මෙම හිඟ මුදල් ගෙවන ලෙස දන්වන ලදි. ශ්‍රීලංගම ඩිපෝවල කාර්ය මණ්ඩල වෙනස්වීම නිසා ණය මුදල් අයකර ගැනීම ප්‍රායෝගිකව දුෂ්කර වී ඇත.

රථ වාහන අළුත්වැඩියා කටයුතු, ආධුනිකයන්ගේ ප්‍රායෝගික පුහුණුවේ අනිවාර්ය අංගයක් වන අතර, ශ්‍රීලංගම බස්රථ අළුත්වැඩියාව තුලින් අදාල අවශ්‍ය ප්‍රායෝගික නිපුණතාවය හා දැනුම ආධුනිකයන්ට ලබාගැනීමේ අවස්ථාව හිමිවේ.

ඒ අනුව, ආධුනිකයන්ගේ මනා ප්‍රායෝගික පුහුණුව තුලින් අදාල පාඨමාලාවල ගුණත්වය ඉහළ නැංවීම ප්‍රමුඛතා අරමුණක් ලෙස ක්‍රියාත්මක කරනු ලැබේ.

දීර්ඝකාලීනව අයකරගත නොහැකි ශේෂයන් අදාල අනුමැතිය සහිතව පොත්වලින් කපාහැරීමට කඩිනමින් කටයුතු කරන බව දන්වා සිටිමි.

(එ) අනුමත කාර්ය මණ්ඩල ඇස්තමේන්තුවට අනුව, බඳවා ගැනීම් පරිපාටියෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු වලට අදාලව සුදුසුකම් සම්බන්ධව පැවති විෂමතා සංශෝධනය කර ගැනීම සඳහා 2020.02.27 දාතමින් ලිපියක් රේඛීය අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යාමු කරන ලදී. 2021.03.01, 2021.04.07, 2021.06.29, 2021.10.12 යන දින වලදී රේඛීය අමාත්‍යාංශයට හා කළමනාකරණ සේවා දෙපාර්මේන්තුව වෙත ලිපි යොමු කලද මෙතෙක් අදාල සංශෝධනයන් ලබා දී නොමැති බැවින්, ඉදිරි කටයුතු සිදු වී නොමැත. තවද බඳවා ගැනීම් හා උසස්වීම් පරිපාටියෙහි ලේඛකාධිකාරී තනතුරෙහි නැවතත් එම සුදුසුකම් සංශෝධනය සඳහා රේඛීය අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් 2022.08.30 දින යොමු කර ඇත.

ආයතනය සඳහා විශේෂ වැටුප් ක්‍රමයක් යෝජනා කරමින් 2020.03.05 දාතමින් රේඛීය අමාත්‍යාංශ ලේකම් මඟින්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ සභාපති ජාතික වැටුප් කොමිසමට ලිපියක් යොමු කල අතර, නැවතත් ඒ සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කරමින්, 2021.12.27 දාතමින් රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙතට හා 2022.01.18 දාතමින් ලිපි රේඛීය අමාත්‍යාංශය වෙතට යොමු කරන ලදී.

නව වැටුප් ප්‍රතිපත්ති සකස් කිරීමේදී අධ්‍යයනය කිරීමට හැකි වන පරිදි එම ගැටලු හා යෝජනා සම්බන්ධයෙන් සකස් කල වාර්තා නැවතත් 2022.01.26 දිනැති ලිපිය මඟින් රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

එහෙත් මේ සම්බන්ධයෙන් මෙතෙක් ප්‍රතිචාරයක් ලැබී නොමැත.

රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික පුහුණු ආයතන වල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින වැටුප් ගැටලු නිරාකරණය කිරීම සඳහා අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පත් කරන ලද කමිටුව සහභාගී වී පවත්නා ගැටලු සම්බන්ධව දැනුවත් කර ඇත.



උපාලි රණසිංහ
අධ්‍යක්ෂ-විදුහල්පති
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය